

# සිංහල

## 4 ශ්‍රේණිය

Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# 5 පාඩම

## ප්‍රාණවාචී නාම පද සමග ක්‍රියාපද භාවිත කරමු.

### ක්‍රියාකාරකම 1

පියවර 1

- පෙළපොතේ **මුහුදු වෙරළ සහ මුහුදු සත්තු** පාඩම (පිටු අංක 91-94) ශබ්දනඟා කියවමු.
- එහි ප්‍රාණවාචී ඒක වචන වාක්‍ය යටින් ඉරක්ද, ප්‍රාණවාචී බහු වචන වාක්‍ය යටින් කඩ ඉරක්ද අඳිමු.

පියවර 2

පියවර 1 හී දි සොයා ගන්නා ලද වාක්‍ය ප්‍රාණවාචී ඒක වචන සහ ප්‍රාණවාචී බහු වචන වාක්‍ය ලෙස වගර් කර වෙන් වෙන් වශයෙන් ලියමු.

### ක්‍රියාකාරකම 2

දී ඇති වැකිවලට අදාළ ඒක වචන සහ බහු වචන වැකි ලියමු.

| | **ප්‍රාණවාචී ඒක වචන වාක්‍ය.** | **ප්‍රාණවාචී බහු වචන වාක්‍ය.** |
|---|---|---|
| 1 | අක්කා පොත් කියවයි. | |
| 2 | | මාළුවෝ දියේ පීනති. |
| 3 | අම්මා ගවුමක් මසයි. | |
| 4 | | මී මැස්සෝ මී වද බඳිති. |
| 5 | කම්කරුවා වෙහෙස වී වැඩ කරයි. | |

ක්‍රියාකාරකම - 3

පියවර 1

- අතීත කාල ක්‍රියාපද ආකාර දෙකකට භාවිත කරමු.පහත ලියා ඇති වැකිවලට අදාළ අතීත කාල වැකි නිල්පාටින් ලියමු.

උදා-

| | |
|---|---|
| මල්ලිලා පාසල් ගියෝ ය. | මල්ලිලා පාසල් ගියහ. |

| | |
|---|---|
| ගොවියෝ කුඹුර කෙටුවෝ ය. | |
| අක්කලා පාසල් ගියෝ ය. | |
| හෙදියෝ රෝගීන් පරීක්ෂා කළෝ ය. | |
| ගවයෝ තණකොළ කෑවෝ ය. | |
| මොනරු පිල් විදහා නැටුවෝ ය. | |

